# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1796/5 - 2013 පෙබරවාරි මස 05 වැනි අඟහරුවාදා - 2013.02.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දෙන ලද විධානය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
මුදල් මණ්ඩලයේ සභාපති/
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

වර්ෂ 2012ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

2012 අංක 6 දරන මුදල් සමාගම් (පොලී අනුපාත) විධානය

1. මෙම විධානය, 2012 අංක 6 දරන මුදල් සමාගම් (පොලී අනුපාත) විධානය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍ර ලාභී සෑම මුදල් සමාගමකටම අදාළ විය යුතු ය. *හැඳින්වීම*

2. 2.1 මුදල් සමාගමක් විසින් 2013 ජනවාරි මස 01 වැනි දිනෙන් පසුව බාරගන්නා හෝ තැන්පතු කාලය අලුත් කරනු ලබන කාලීන තැන්පතු සඳහා ගෙවිය හැකි වාර්ෂික පොලී අනුපාතිකයන් පහත දක්වා ඇති උපරිම ඉහළ සීමාවන් නොඉක්මවිය යුතු ය. *කාලීන තැන්පතුවක් සඳහා වන උපරිම පොලී අනුපාතය*

| *කාලීන තැන්පතුව කල් පිරෙන කාල සීමාව* | *පොලී අනුපාතිකයන්ගේ උපරිම ඉහළ සීමාවන්* | |
|---|---|---|
| වසරක් හෝ වසරකට අඩු | 2012 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන කාර්තුව තුළදී නිකුත් කරන ලද, දින 364ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාල බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය (ඉන්පසු, අධ්‍යක්ෂවරයා විසින් කාර්තුවකට වරක් දැනුම් දෙනු ලබන කාර්තුවක් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අනුපාත) | ට ප්‍රතිශත අංක 2.00ක් එකතු කිරීමෙන් ලැබෙන අගය |
| වසරකට වැඩි - වසර 3 දක්වා | | ට ප්‍රතිශත අංක 2.50ක් එකතු කිරීමෙන් ලැබෙන අගය |
| වසර 3ට වැඩි - වසර 5 දක්වා | | ට ප්‍රතිශත අංක 3.00ක එකතු කිරීමෙන් ලැබෙන අගය |

2.2 වයස අවුරුදු 55ට වැඩි පුද්ගලයකුගේ (මෙහි මින් මතු "ජ්‍යෙෂ්ඨ පුරවැසියා" ලෙස හැඳින්වෙන) කාලීන තැන්පතුවක් භාර ගැනීමේදී හෝ නැවත අලුත් කිරීමේදී, මුදල් සමාගම විසින් මෙම ඡේදයෙහි 2.1 අනුව නියමිත පොලී අනුපාතිකයන්ගේ උපරිම ඉහළ සීමාවන්ට වඩා ප්‍රතිශත අංක එකක් (1) වැඩියෙන් ගෙවිය හැකි ය.

**පැවරිය නොහැකි තැන්පතු සඳහා වන උපරිම වට්ටම් අනුපාතික**

3. මුදල් සමාගමක් විසින් 2013 ජනවාරි මස 01 වැනි දිනෙන් පසුව, කල්පිරීමේ දී මුදාහැරීම සඳහා ගෙවන වටිනාකමට වඩා අඩු මිලකට පැවරිය නොහැකි තැන්පතු සහතික නිකුත් කිරීමකදී ලබා දෙන වට්ටම අනුපාතික එම තැන්පතු ආයෝජනයක උපරිම වාර්ෂික ඵලදාව, පහත දක්වා ඇති උපරිම ඉහළ සීමාවන් නොඉක්මවිය යුතු ය.

| *පැවරිය නොහැකි තැන්පතු සහතික පත් කල් පිරෙන කාලසීමාව* | *උපරිම වාර්ෂික ඵලදායී අගය* | |
|---|---|---|
| වසරක් හෝ වසරකට අඩු | 2012 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන කාර්තුව තුළදී නිකුත් කරන ලද, දින 364ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාල බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය (ඉන්පසු, අධ්‍යක්ෂවරයා විසින් කාර්තුවකට වරක් දැනුම් දෙනු ලබන කාර්තුවක් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අනුපාත) | ට ප්‍රතිශත අංක 2.00ක් එකතු කිරීමෙන් ලැබෙන අගය |
| වසරකට වැඩි - වසර 3 දක්වා | | ට ප්‍රතිශත අංක 2.50ක් එකතු කිරීමෙන් ලැබෙන අගය |
| වසර 3ට වැඩි - වසර 5 දක්වා | | ට ප්‍රතිශත අංක 3.00ක එකතු කිරීමෙන් ලැබෙන අගය |

**ඉතිරි කිරීමේ තැන්පතුවක් සඳහා වන උපරිම පොලී අනුපාතිකය**

4. 4.1 මුදල් සමාගමක් විසින් ඕනෑම ඉතිරිකිරීමේ තැන්පතුවක් සඳහා ගෙවිය හැකි උපරිම වාර්ෂික පොලී අනුපාතය, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාර්තුව තුළ දී නිකුත් කරන ලද, දින 91 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය (ඉන්පසු, අධ්‍යක්ෂවරයා විසින් කාර්තුවකට වරක් දැනුම් දෙනු ලබන කාර්තුවක් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අනුපාතය) නොඉක්මවිය යුතු ය.

4.2 එසේ වුව ද, ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් විසින් ඉතිරිකිරීමේ තැන්පතුවක් පවත්වාගෙන යාමේ දී, මුදල් සමාගමක් විසින්, මෙම ඡේදයෙහි 4.1 අනුව නියමිත පොලී අනුපාතිකයන්ගේ උපරිම ඉහළ සීමාවට වඩා ප්‍රතිශත අංක එකක් (1) වැඩියෙන් ගෙවිය හැකි ය.

5. දින 91ක හා දින 364 ක භාණ්ඩාගාර බිල්පත් හි කාර්තුවක් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අනුපාත, අධ්‍යක්ෂවරයා විසින් මාර්තු 31, ජූනි මස 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන එක් එක් කාර්තුව සඳහා දැනුම් දෙනු ලබයි.

**වාර්තා කිරීම**

6. සෑම මුදල් සමාගමක් විසින් ම, එම මුදල් සාමගම විසින් කිසියම් මාසයක දී ගෙවන ලද පොලී අනුපාතික සහ පැවරිය නොහැකි තැන්පතු සහතික සඳහා අදාළ වට්ටම් අනුපාතික පිළිබඳ විස්තර එම මාසයට පසුව එළඹෙන මාසයේ 07 වැනි දින හෝ එදිනට ප්‍රථම, අධ්‍යක්ෂවරයා වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

**අර්ථ දැක්වීම**

7. මෙම විධානයෙහි ;

7.1 "කාලීන තැන්පතු" යන්නෙන් නිශ්චිත කාලසීමාවක් තුළ ආපසු ගෙවීමේ එකඟතාවයක් මත මුදල් සාමාගමක් විසින් භාරගනු ලබන ඕනෑම තැන්පතුවක් අදහස් වේ ; සහ

7.2 "අධ්‍යක්ෂවරයා" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

**අහෝසි කිරීම**

8. 2012.09.28 දින නිකුත් කරන ලද 2012 අංක 5 දරන මුදල් සමාගම් (පොලී අනුපාත) විධානය මෙයින් අහෝසි කරනු ලැබේ.

02-677

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.